සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව / தென் மாகாணக் கல்வித் திணைக்களம்**

**DEPARTMENT OF EDUCATION-SOUTHERN PROVINCE**

**අවසාන වාර පරීක්ෂණය - 2021 (2022 මාර්තු)**

| 11 ශ්‍රේණිය | ශිල්ප කලා - I | කාලය පැය 01 යි |
|---|---|---|


නම / විභාග අංකය ......................................................................................................................

**ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

(1) පහත දැක්වෙන කර්මාන්ත අතුරෙන් ශාන්ති කර්ම උදෙසා නිර්මාණය වූ ජන කලා කර්මාන්තය කුමක් ද?


(1) ලාක්ෂා කර්මාන්තය
(2) මැටි කර්මාන්තය
(3) පේෂ කර්මාන්තය
(4) වෙස් මුහුණු කර්මාන්තය

(2) A, B, C, D යන ජ්‍යාමිතික රූප මගින් දැක්වෙන කෝණ අතුරෙන් $90^0$ ට වැඩි අගයකින් යුතු කෝණ පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.




(1) A හා B
(2) A හා D
(3) B හා C
(4) C හ D

(3) සරල රේඛාවකට ලම්බකයක් ඇඳීමේ ජ්‍යාමිතික නිර්මාණය රූපයෙන් දැක්වේ. එම ලම්බකය ඇඳ ඇත්තේ





(1) සරල රේඛාව සමච්ඡේදනය කිරීමටය.
(2) සරල රේඛාව මධ්‍යයේ පිහිටි ලක්ෂ්‍යයකදීය.
(3) සරල රේඛාව අන්තයේ පිහිටි ලක්ෂ්‍යයකදීය.
(4) බාහිර ලක්ෂ්‍යයක සිට සරල රේඛාවටය.

(4) පහත රූපයේ දැක්වෙන CAB කෝණය විහිත චතුරස්‍ර යුගලය භාවිතයෙන් නිර්මාණය කර ඇත. මෙම කෝණයේ අගය

(1) $105^0$ කි. (2) $120^0$ කි.

(3) $135^0$ කි. (4) $150^0$ කි.




(5) කාර්මික ඇඳීම විෂයයෙහිදී භාවිත කරන සම්මත රේඛා වර්ග අතර, පහත දැක්වෙන රේඛාව භාවිත කරනු ලබන්නේ -----------------------

(1) වස්තුවක පෙනෙන දර දැක්වීම සඳහා ය.

(2) මධ්‍ය අක්ෂය හා සමමිතික බව පෙන්වීම සඳහා ය.

(3) ඡේදනය කළ යුතු ස්ථාන දැක්වීම සඳහා ය.

(4) සැඟි දර දැක්වීම සඳහා ය.

(6) එක්තරා ජ්‍යාමිතික රූපයක සම්මුඛ පාද සමාන හා සමාන්තර වේ. තවද එහි සම්මුඛ කෝණ සමාන වන අතර, විකර්ණ දිගින් අසමාන වේ. එම ජ්‍යාමිතික රූපය මින් කුමක් ද?

(1) ත්‍රපීසියම (2) ත්‍රිකෝණය

(3) රොම්බසය (4) රොම්භාබය

(7) යම්කිසි අචල ලක්ෂ්‍යයකට සමදුරින් එකම තලයක් මත චලනය වන ලක්ෂ්‍යයක පථය හඳුන්වනු ලබන්නේ

(1) වෘත්තය ලෙස ය. (2) ඉලිප්සය ලෙස ය.

(3) සංවෘත රූපය ලෙස ය. (4) වක්‍ර පෘෂ්ඨය ලෙස ය.

(8) සිලින්ඩරයක විකසනයක් නිර්මාණය කිරීමේදී අඳිනු ලබන විකසන රේඛාවේ දිග සමාන වන්නේ

(1) වක්‍ර පෘෂ්ඨයේ අරයට ය.

(2) සිලින්ඩරයේ පරිධියට ය.


(3) සිලින්ඩරයේ උසට ය.

(4) වක්‍ර පෘෂ්ඨයේ විෂ්කම්භයට ය.

(9) පහත රූපයේ දැක්වෙන බහු අස්‍රයේ දක්වා ඇති සියලු කෝණ

(1) සුළු කෝණ වේ. (2) ඍජු කෝණ වේ.

(3) මහා කෝණ වේ. (4) පරාවර්ත කෝණ වේ.



(10) පහත පිළිතුරු අතරින් ඇල සමාන්තරාස්‍ර ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) සමචතුරස්‍රය, ඍජුකෝණාස්‍රය

(2) රොම්බසය, රොම්බාභය

(3) රොම්බාභය, සමචතුරස්‍රය

(4) රොම්බසය, ඍජුකෝණාස්‍රය.

(11) ද්විතියික වර්ණ සෑදෙන්නේ කෙසේද?

(1) මූලික වර්ණ දෙකක් සම්මිශ්‍රණය වීමෙනි.

(2) මූලික වර්ණ එකක් හා ද්විතියික වර්ණයක් සම්මිශ්‍රණය වීමෙනි.

(3) මූලික වර්ණ එකක් හා තෘතීය වර්ණයක් සම්මිශ්‍රණය වීමෙනි.

(4) ද්විතියික වර්ණ වෙනත් ද්විතීයික වර්ණ හා මුසු වීමෙනි.

(12) රෙදිපිළි අලංකරණයේදී සායම් හොඳින් උරා ගැනීම සඳහා අනුගමනය කරනු ලබන ක්‍රමවේද හඳුන්වන්නේ

(1) පසු පිරියම් කිරීම යනුවෙනි. (2) පෙර පිරියම් කිරීම යනුවෙනි.

(3) මුද්‍රණය කිරීම යනුවෙනි. (4) නිමහම් කිරීම යනුවෙනි.

(13) ස්වභාවිකව පිහිටි රටාවක් මත හෝ කපා ගත් මෝස්තරයක් මත සායම් ආලේප කර මුද්‍රා තැබීමේ ක්‍රියාවලිය හඳුන්වන්නේ,

(1) අච්චු මුද්‍රණය යනුවෙනි. (2) බතික් මුද්‍රණය යනුවෙනි.

(3) ස්ටෙන්සිල් මුද්‍රණය යනුවෙනි. (4) තිර රාමු මුද්‍රණය යනුවෙනි.

(14) බතික් ක්‍රමයේදී වර්ණ උරා ගැනීමේ ශක්තිය ප්‍රබල රෙදි වර්ගයක් ඒ සඳහා තෝරා ගත යුතුය. පහත දැක්වෙන රෙදි වර්ග අතුරෙන් වඩා සුදුසු වන්නේ කුමක් ද?

(1) ටෙට්රන් (2) සේද රෙදි

(3) පොප්ලින් (4) විස්කෝස්

(15) ගැටපඬු අලංකරණයේදී විසිතුරු රටා මතු කර ගනු ලබන්නේ

(1) නූල් ආධාරයෙන් රටා ලැබෙන ලෙස ගැට යොදා ගැනීමෙනි.

(2) ප්‍රමිතියකට සැකසූ ඉටි මිශ්‍රණයක් ආලේප කිරීමෙනි.

(3) රසායනික ද්‍රව්‍ය භාවිතයෙන් රටා ඉස්මතු කර ගැනීමෙනි.

(4) රටා මතුවන ලෙස වර්ණ භාවිත කිරීමෙනි.

(16) අච්චු මුද්‍රණ ක්‍රමයෙන් රෙද්දක් අලංකාර කිරීමේ දී අනුගමනය කළයුතු පියවර පහත දැක්වේ. ඒවායේ නිවැරදි අනුපිළිවෙල දැක්වෙන පිළිතුර තෝරන්න.

A - අච්චු මුහුණතෙහි සායම් ආලේප කිරීම

B - මුද්‍රණ තලය මත රෙදිකඩ අතුරා හොඳින් සවි කිරීම

C - සායම් ගෑල් වූ අච්චුවෙන් රටාවට අනුව මුද්‍රා තැබීම

D - මඳ පවනේ වියළීමට තැබීම

(1) A, B, C, D (2) C, D, B, A

(3) B, A, C, D (4) A, B, D, C

(17) සායම් භාවිතයෙන් අනතුරුව පසු පිරියම් ක්‍රම භාවිත කිරීම රෙදිපිළි අලංකරණයේදී අනිවාර්යයෙන් සිදු කෙරේ. පසු පිරියම් කරණයෙන් අපේක්ෂා කරන්නේ

(1) වැඩිපුර ඇති සායම් ප්‍රමාණය ඉවත් කර ගැනීම ය.

(2) යොදන ලද සායම් ස්ථිර කර ගැනීම ය.

(3) රෙදි වල කල් පැවැත්ම තහවුරු කර ගැනීම ය.

(4) වර්ණක උරා ගැනීමේ ශක්තිය ඇති කිරීම

(18) බතික් නිර්මාණ සඳහා භාවිත කරනු ලබන වර්ණක කාණ්ඩය තෝරන්න.

(1) සරල සායම්, සල්පර්, අම්ල සායම්

(2) නෙප්තෝල්, වැට් සහ ප්‍රෝසියන් සායම්

(3) සල්පර්, ඇසොයික් සහ අපකිරණ සායම්

(4) අපකිරණ සායම්, මෝඩන්ට් සායම්, සහ ක්‍රෝම් සායම්

(19) පිළි අලංකරණ ක්‍රමයක් වන සිදුරු තහඩු මුද්‍රණය සඳහා භාවිත කරන උපකරණ පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) මුද්‍රණ තලය, මෝස්තර සහිත ස්ටෙන්සිලය හා පින්සල

(2) සායම් පෑඩය, මුද්‍රණ තලය, මෝස්තර සහිත අච්චුව

(3) සායම් ඉසිනය, මුද්‍රණ තලය, මෝස්තර සහිත තහඩුව

(4) ස්ක්‍යුජිය, මුද්‍රණ තලය, මෝස්තර සහිත රාමුව

(20) කෙඳි හඳුනා ගැනීමේදී සිදු කරන පිළිස්සුම් පරීක්ෂාවේදී කඩදාසි පිළිස්සෙන ගඳ වහනය වන, කහ පාට ලොකු ගිනි දලු ඇතිවන කෙඳි විශේෂය වන්නේ

(1) කපු කෙඳි ය. (2) ලිනන් කෙඳි ය.

(3) ඛනිජ කෙඳිය (4) ලෝම කෙඳිය

(21) රිබන් එම්බ්‍රොයිඩරි සඳහා භාවිත කරනු ලබන අත්‍යවශ්‍ය උපකරණයක් වන්නේ,


(1) රිබන් ඉඳිකටුව හා ස්ටැපැස්ට් ඉඳිකටුව ය.

(2) උල්තුඩ සහිත ඉඳිකටුව හා මොට තුඩ සහිත ඉඳිකටුව ය.

(3) මැෂින්ඉඳිකටුව හා උල්තුඩ සහිත ඉඳිකටුව ය.

(4) හර්නල් කටුව හා උල් තුඩ සහිත ඉඳිකටුව ය.

(22) පහත දැක්වෙන වියමන් රටා අතරින් චාම් වියමනේ ප්‍රභේදයක් වන්නේ කුමක් ද?



(1) (2) (3) (4)

(23) මස්ලින්. පොප්ලින්. මල්පීස් යන රෙදි වර්ග වියීම සඳහා වඩාත් සුදුසු වියමන් රටාව පහත දී ඇති පිළිතුරු අතරින් තෝරන්න.

(1) මැට් වියමන (2) සරල හීරි වියමන

(3) චාම් වියමන (4) දික්දර වියමන

(24) බාස්කට්, හොප්සැක්, පැහි යන නම් වලින් හඳුන්වන රටාව කුමක්ද?

(1) චාම් වියමන (2) මැට් වියමන

(3) දික්දර වියමන (4) හරස්දර වියමන

(25) රෙදි විවීමේ ක්‍රියාවලියේදී හරස් නූල් තද කර ගැනීමට භාවිත කරන උපකරණ වන්නේ

(1) පුඩුවැල් ය. (2) පනාව ය.

(3) ලීවර ය. (4) පාපොලු ය.

(26) විවීමේ යන්ත්‍රයක වියන්නාට ඉදිරියෙන් සිටින සේ 'අළුව' සවි කර ඇත. මින් ඇති ප්‍රයෝජනයක් වන්නේ,

(1) අත්වැල ආධාරයෙන් නඩාව මගින් හරස් නූල් එහා මෙහා ගමන් කරවීම ය.

(2) නූල් තට්ටු උස් පහත් කර ගැනීම ය.

(3) නූල් අවුල් නොවී තබා ගැනීම ය.

(4) පුඩුවැල් වලින් හා පනාවෙන් නූල් ඇද ගැනීම ය.

(27) නූල් හැදයක් සකස් කිරීමේ දී 'සීරු දැමීම' සඳහා භාවිත කරන උපකරණය කුමක් ද?

(1) නූල් බෙරය. (2) දික් නූල් කූරු රාක්කය

(3) නූල් බෙත්ම (4) නූල් දික් ගසන ලෑල්ල

(28) මෙට්‍රික් අංක $16^{s}$ නූල් කිලෝ ග්‍රෑම් 5 ට ඇති කැරලි සංඛ්‍යාව කොපමණ ද?

(1) 160 කි (2) 80 කි.

(3) 16 කි. (4) 40 කි.

(29) මීටර් 50 ක් දිග, සෙ.මී. 90 ක් පළල ඇඳ රෙදි හැදයක සෙ.මී. එකකට දික් නූල් පොටවල් 30 ක් යොද ගෙන ඇත. මෙම හැදයේ ඇති නූල් පටවල් ගණන කීයද?

(1) 50 x 30 = 1500 (2) 90 x 30 = 2700

(3) 50 x 90 = 4500 (4) 50 x 90 x 30 = 1350,000

(30) අත් පිස්නා හැදයක්විවීම සඳහා දෙපට නූල් කැරලි 50 ක් වැය වී ඇත. නූල් කිලෝ ග්‍රෑම් එකක එම නූල් කැරලි 40 ක් අඩංගු වන්නේ නම් එම නූලේ අංකය වන්නේ,

(1) $2/80^{s}$ ය. (2) $40^{s}$ ය.

(3) $50^{s}$ ය. (4) $2/100^{s}$ ය.

(31) ජීර්ණය වූ ස්ථානයේ සිට වැසි සුළං සහ ගංගා ඇළ දොළ ආදී ජල ප්‍රවාහ මගින් වෙනත් ස්ථානයක තැන්පත් වන මැටි හඳුන්වන්නේ කෙසේ ද?

(1) පිහිටි මැටි (2) ප්‍රාථමික මැටි

(3) ශේෂ මැටි (4) අගම් මැටි

(32) උළු ගඩොල්, පෝරණු උපාංග, බිම් ගඩොල් සහ විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ දී භාවිතා කරන මැටි විශේෂය වන්නේ

(1) ප්‍රාථමික මැටි ය. (2) ද්විතීයික මැටි ය

(3) තලප මැටි ය. (4) ශේෂ මැටි ය.

(33) මැටි භාණ්ඩ නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ඇලෙන සුළු අමුද්‍රව්‍යයක් විය හැක්කේ මින් කුමක් ද?

(1) ෆෙල්ස්පාර් (2) ක්වාට්ස්

(3) ඩොලමයිට් (4) කෙඔලින්

(34) පිලිස්සීම සඳහා භාවිතයට ගැනෙන උෂ්ණත්ව ප්‍රමාණය අනුව මැටි භාණ්ඩ වර්ග තුනකට වෙන්කර දැක්විය හැකිය. පෝසිලේන් භාණ්ඩ සඳහා පවත්වා ගත යුතු උෂ්ණත්ව පරාසය වන්නේ

(1) $900^{0}C$ - $1200^{0}C$ (2) $1200^{0}C$ - $1250^{0}C$

(3) $1250^{0}C$ - $1350^{0}C$ (4) $850^{0}C$ - $900^{0}C$

(35) හම් පදම් අවස්ථාවේදී මැටි භාණ්ඩ සඳහා භාවිතා කරන අලංකරණ ක්‍රමයක් වන්නේ

(1) ඔන්ගෝබ් කිරීම (2) සායම් ආලේප කිරීම

(3) ස්පොන්ජ් කැබලි භාවිතයෙන් අලංකාර කිරීම (4) සායම් තුළ ගිල්ලවීම

(36) මැටි භාණ්ඩ අලංකරණය සඳහා කඩදාසි විවිධ අයුරින් යොදා ගත හැකිය. වර්ණවත් කඩදාසි ඉරා අලවා ගැනීම මගින් කරන නිර්මාණ හඳුන්වන්නේ

(1) පල්ප් නිර්මාණ ලෙස ය. (2) ඩෙකෝපාජ් නිර්මාණ ලෙස ය.

(3) කොලාජ් නිර්මාණ ලෙස ය. (4) ස්ටෙන්සිල් නිර්මාණ ලෙස ය.

(37) නිදුල තටු පිලිස්සීම හෙවත් බිස්කට් පිලිස්සීම යනු කුමක් ද?

(1) සෙරමික් භාණ්ඩ පළමු පිලිස්සීමට භාජනය කිරීම ය.

(2) ඉහළ උෂ්ණත්වයකට පිලිස්සීම ය.

(3) පහළ උෂ්ණත්වයකට පිලිස්සීම ය.

(4) සෙරමික් භාණ්ඩ දෙවන පිලිස්සීමකට භාජනය කිරීම ය.

(38) සකපෝරුව මඟින් මැටි භාණ්ඩයක් ඉදි කිරීමේදී මුල්ම පියවර වශයෙන් කළ යුත්තේ කුමක් ද?

(1) මැටි පිඩ විවෘත කිරීමයි. (2) මැටි පිඩ මධ්‍යගත කිරීමයි.

(3) අවශ්‍ය වයනය ලබා ගැනීමයි. (4) පදම් කරගත් මැටි පිඩ සකපෝරුව මත සවි කිරීමයි.

(39) සුවිකාර්යතාවය අඩු මැටි වලට අවශ්‍ය නම්‍යතාව ඇති කර ගැනීම සඳහා කළ යුත්තේ කුමක් ද?

(1) කෙඔලින් මැටි මිශ්‍ර කර ගත යුතුය.
(2) තලප මැටි මිශ්‍ර කර ගත යුතුය.
(3) රතු මැටි මිශ්‍ර කර ගත යුතුය.
(4) ගිනි මැටි මිශ්‍ර කර ගත යුතුය.

(40) මැටි ජලය සමඟ එක්වීමේ දී ඇතිවන ඇලෙන සුලු බව හඳුන්වන්නේ

(1) සව්වරතාව ලෙස ය.
(2) සුවිකාර්යතාව ලෙස ය.
(3) හැකිලීම ලෙස ය.
(4) නම්‍යතාව ලෙස ය.

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** / தென் மாகாணக் கல்வித் திணைக்களம்

**DEPARTMENT OF EDUCATION-SOUTHERN PROVINCE**

**අවසාන වාර පරීක්ෂණය - 2021 (2022 මාර්තු)**

| 11 ශ්‍රේණිය | **ශිල්ප කලා II** | කාලය පැය 02 යි |
|---|---|---|

**නම/විභාග අංකයඃ**..........................................................................................................

ශිල්ප කලා II

**අනිවාර්ය ප්‍රශ්න අංක 01 සහ තෝරාගත් තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

(1) "සියරට දේ සිරිසැප දේ" යන තේමාව යටතේ දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය සහ කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව එක්ව සංවිධානය කර ඇති වෙළඳ ප්‍රදර්ශනය සහ පාසල් දරුවන්ගේ නිර්මාණ ඇගයීමක් සිදු කර සම්මාන ප්‍රදානයක් සිදු කෙරේ.

(i) මෙම ප්‍රදර්ශනයේ තේමා පාඨය ඇතුළත් පෝස්ටරයක් නිර්මාණය කරන්න.

(ii) උත්සවය සඳහා ප්‍රවිෂ්ඨ වන මාර්ගය අලංකාර කිරීමට සුදුසු දේශීය අමුද්‍රව්‍ය 4 ක් ලියන්න.

(iii) ආරාධිත අමුත්තන්ට යැවීම සඳහා සුදුසු ආරාධනා පත්‍රයක ආකෘතිය ඇද දක්වන්න.

(iv) උත්සවයේ සංවිධායක මණ්ඩලයට පැළඳවීමට සුදුසු ලාංඡනයක් නිර්මාණය කරන්න.

(v) නිර්මාණ ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කිරීමට සුදුසු භාණ්ඩ නිර්මාණය කළ හැකි පාරම්පරික කර්මාන්ත 4 ක් නම් කරන්න.

(vi) එම කර්මාන්ත වලට අදාළව ප්‍රදර්ශනයට ඉදිරිපත් කල හැකි භාණ්ඩ 4 ක් නම් කරන්න.

(vii) උත්සවයේ නැටුම් කණ්ඩායමේ ගැහැණු ළමුන්ගේ ඇඳුමට පින්තාරු කිරීමට සුදුසු මෝස්තරයක් අඳින්න.

(viii) වෙළෙඳ කුටි තුළ අලෙවියට චාම් වියමනෙන් වියන ලද කුඩා අත්ලේන්සු සකස් කර තබා ඇත. චාම් වියමන ඇඳ දක්වන්න.

(ix) 10% ක ලාභයක් ඇතිව භාණ්ඩ විකිණීමට අවසර ලැබී ඇති හෙයින් පොල්කටු ආශ්‍රිත මල්පොකුරක් සඳහා රු. 500 ක් වැය වී ඇත්නම් වෙළඳපොලට වන මිල කීයද?

(x) උත්සවයේ කෙටි ආහාර පිරිනැමීම සඳහා සුදුසු කාඩ්බෝඩ් ඇසුරුමක රූපීය පෙනුම ඇඳ දක්වන්න. (ලකුණු - 20)

(2) පාරිභෝගිකයා රෙදිපිළි මිලදී ගැනීමේ දී සැලකිලිමත් වන්නේ අලංකරණ රටා පිළිබඳවය.

(i) අච්චු මුද්‍රණ ක්‍රමයෙන් රෙදිපිළි අලංකාර කර ගැනීමේදී අච්චුව මත සායම් ආලේපනය කළ හැකි ක්‍රම දෙකක් දක්වන්න. (ලකුණු - 02)

(ii) පිළි මුද්‍රණයේදී භාවිතා කරන අච්චු මුද්‍රණ ක්‍රමයේ වාසි 2 ක් දක්වා අච්චුවකට සුදුසු මෝස්තරයක් ඇඳ මුද්‍රණය විය යුතු කොටස් සේයා කර දක්වන්න. (ලකුණු - 03)

(iii) කෙඳි වර්ග ස්වාභාවික හා කෘත්‍රිම ලෙස ප්‍රධාන වශයෙන් වර්ග කෙරේ. වගු සටහනක මාර්ගයෙන් කෙඳි වර්ගීකරණය පැහැදිලි කරන්න. (ලකුණු - 05)

(3) අතීතයේදී මෙන්ම වර්තමානයේ රෙදිපිළි අලංකරණය සඳහා විවිධ ක්‍රම යොදගනු ලැබේ.

(i) සායම් භාවිතයෙන් සිදු කරනු ලබන රෙදිපිළි අලංකරණ ක්‍රම 4 ක් නම් කරන්න. (ලකුණු - 02)

(ii) පෙර පිරියම් ක්‍රියාවලිය පිළිබඳව විස්තර කරන්න. (ලකුණු - 03)

(iii) රිබන් නිර්මාණය සඳහා යොදා ගන්නා මැහුම් ක්‍රම දෙකක් නම් කරන්න. එම මැහුම් ක්‍රම ඇසුරෙන් බිත්ති සැරසිල්ලකට සුදුසු මෝස්තරයක් චිත්‍රණය කරන්න. (ලකුණු - 05)


(4) රූපයේ දැක්වෙන්නේ ඩෙනිම් කලිසම් රෙදි විවීම සඳහා සකස් කරන ලද නූල් හැදයකි.

හැදයේ දිග මීටර 100 හැදයේ, පළල සෙන්ටිමීටර් 30

දික් සෙන්ටිමීටරයකට නූල් පොටවල් ගණන 60 කි.

නූලේ නොම්මරය $2/40^s$

නූලේ වර්ණය නිල්




(i) ඩෙනිම් කලිසම් රෙදි විවීමට සුදුසු වියමන් රටා දෙකක් නම් කරන්න. (ලකුණු - 02)

(ii) ඉහත (i) ට අදාළ ඔබ සඳහන් කළ එක් වියමනක මතුපිට නූල් මතුවීමේ ක්‍රමය ප්‍රස්තාර ගත කරන්න. (ලකුණු - 03)

(iii) හැදය සඳහා අවශ්‍ය දික් නූල් ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු - 05)

(5) රෙදි විවීමේදී මෙන්ම ගෙතීමේදී නූල් භාවිතයට ගැනේ. අත්යන්ත්‍ර පේෂකර්මාන්තයේ පලමුවන කාර්යය වන්නේ නූල් ඔතා ගැනීමයි.

(i) නූල් එතීම සඳහා භාවිතා කෙරෙන උපකරණ කට්ටලය නම් කරන්න. (ලකුණු - 02)

(ii) ඉන් එක් උපකරණයක දළ රූප සටහන අදින්න. (ලකුණු - 03)

(iii) පනාව, පුඩුවැල්, ලීවර සහ පාපොලු යන එක් එක් අත් යන්ත්‍ර කොටසින් කෙරෙන කාර්ය විස්තර කරන්න. (ලකුණු - 05)

(6) විවිධ අවශ්‍යතා සඳහා භාවිතා කෙරෙන මැටි භාණ්ඩ නිෂ්පාදනය කිරීමත් අලංකාර ක්‍රම මගින් ඒවා විසිතුරු කර ගැනීමත් වර්තමානයේ දැඩි උනන්දුවකින් සිදු කෙරේ.

(i) පිලිස්සීමෙන් පසු මැටි භාණ්ඩවල සිදුවන වෙනස්කම් 2 ක් සඳහන් කරන්න. (ලකුණු - 02)

(ii) මැටි භාණ්ඩ අලංකාර කර ගැනීම සිදු කරන අවස්ථා දෙකක් සඳහන් කර එයින් එක අවස්ථාවක සිදු කරන අලංකරණ ක්‍රමයක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු - 03)

(iii) මැටි දරුණු ආධාරයෙන් භාණ්ඩයක් සාදා ගන්නා ආකාරය පියවර වශයෙන් දක්වන්න.

(ලකුණු - 05)

(7) වර්තමානයේ නිවාස සැලසුම් කරණයේදී උද්‍යාන අලංකරණ පිළිබඳව විශේෂ අවදානයක් යොමු කරයි.

(i) උද්‍යාන අලංකරණ නිර්මාණයේදී සැලකිලිමත් විය යුතු උද්‍යාන විද්‍යා මූල ධර්ම 4ක් සඳහන් කරන්න. (ලකුණු - 02)

(ii) උද්‍යාන අලංකරණ සඳහා භාවිතා කරන, මාධ්‍ය දෙකක් නම් කර එක් මාධ්‍යයකින් කළ හැකි නිර්මාණයක දල රූප සටහනක් අදින්න. (ලකුණු - 03)

(iii) එම නිර්මාණය සිදු කරන ආකාරය පියවර වශයෙන් පැහැදිලි කරන්න. (ලකුණු - 05)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව / தென் மாகாணக் கல்வித் திணைக்களம்**

**DEPARTMENT OF EDUCATION-SOUTHERN PROVINCE**

**අවසාන වාර පරීක්ෂණය - 2021 (2022 මාර්තු)**

# ශිල්ප කලා II

**පිළිතුරු පත්‍රය**

(1) (i) ඇඳ ඇති නිර්මාණශීලී පෝස්ටරයට ලකුණු ලබා දෙන්න.

(ii) ශාක ගෙඩි, පත්‍ර, ගොක්කොළ, කෙසෙල් පතුරු, මල් වර්ග

(iii) සුදුසු ආරාධනා පත්‍රයක් වෙනුවෙන්

(iv) නිර්මාණශීලී ලාංඡනයක් වෙනුවෙන් ලකුණු ලබාදෙන්න.

(v) මැටි කර්මාන්තය, වෙස්මුහුණු කර්මාන්තය, පේෂ කර්මාන්තය, ලාක්ෂා කර්මාන්තය, පන් හා පැදුරු, බීරළු රේන්ද වැනි කර්මාන්ත

(vi) ඉහත කර්මාන්ත වල ඕනෑම නිෂ්පාදනයක් වෙනුවෙන්

(vii) පින්තාරු සඳහා සුදුසු මෝස්තරයක් වෙනුවෙන්

(viii) චාම් වියමන් ප්‍රස්තාරයට

(ix) $\frac{10}{100}$ x 500 = 50 රු. 550.00

(x) ඇඳ ඇති ජ්‍යාමිතික රූපය වෙනුවෙන් ලකුණු ලබා දෙන්න. ලකුණු 2 x 10 = 20

**2 සිට 7 දක්වා පිළිතුරු**

(2) (i) මුද්‍රණ පෑඩය මත සායම් බහා අච්චු එහි තෙරපා ගැනීම

වීදුරු තලයක් මත සායම් වත් කර රෝලයක එම සායම් තවරා අච්චු මුහුණත මත රෝලරය හොඳින් පෙරළා සායම් ගැල්වීම

පින්සලක් මගින් අච්චු මුහුණතෙහි වර්ණ ආලේප කිරීම

(ලකුණු 2)

(ii) සමාන හැඩතල එකම ආකාරයට පවත්වාගෙන යාම

වර්ණ ගැන්වීම එකම අයුරින් පවත්වා ගැනීම


එකම අච්චුව පැති වෙනස් කරමින් මුද්‍රා තැබීම මගින් විවිධ රටා මතු කර ගත හැකිවීම

තමා කැමති මෝස්තර මුද්‍රා තබා ගත හැකිවීම

කාලය හා ශ්‍රමය ඉතිරිවීම

දව හා ලිනෝලියම් මාධ්‍යයේ අච්චු නැවත නැවත භාවිතයට ගත හැකි වීම. (ලකුණු 03)

(iii) 10 ශ්‍රේණියේ ශිල්ප කලා පොතේ 69 පිටුව බලන්න.




(3) ප්‍රශ්නය

(i) පින්තාරු කිරීම , සිදුරු තහඩු මුද්‍රණය, අච්චු මුද්‍රණය, සේද රාමු මුද්‍රණය (ලකුණු 02)

(ii) නිෂ්පාදිත රෙදි වල ස්වාභාවිකව හා බාහිරව එක් වූ අපද්‍රව්‍ය ඉවත් කිරීමේ ක්‍රියාවලිය පෙර පිරියම්කරණය වේ. (ලකුණු 02)

කැඳහරණය

මලහරණය

විරංජනය (ලකුණු 03)

(iii) රිබන් මැස්ම

කෙලින් මැස්ම

ලේසි ඩේසි මැස්ම

නැටි මැස්ම

ලූප් මැස්ම

ප්‍රංශ ගැට මැස්ම

බිත්ති සැරසිල්ලේ චිත්‍රයට (ලකුණු 03)

**11 ශ්‍රේණිය - ශිල්ප කලා**

**2-7 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු**

(4) (i) ඩෙනිම් කලිසම් රෙදි විවීම සඳහා වියමන්

චාම් වියමන් ප්‍රභේද

චාම්, ජටා, හීරි

හීරි වියමන් ප්‍රභේද අතරින් සරල හීරි තුඩුහිරි, දඟරහිරි. මේවා අතරින් වියමන් රටා දෙකක් නම් කිරීම (ලකුණු 02)

(ii) ප්‍රස්ථාර කිරීම

සඳහන් කළ එක් වියමනක මෝස්තරය ඇඳීම (ලකුණු 03)

හැදය සඳහා අවශ්‍ය දික් නූල් ප්‍රමාණය ගණනය කිරීම

$$\frac{100 \text{ x } 30 \text{ x } 60 \text{ x } 2}{1000 \text{ x } 40} = 9\text{kg}$$

හැදයේ දිග x හැදයේ පළල x ඒකකයට ඇති දික් නූල් පොට ගණන

නූල් කැරැල්ලක දිග x නූලේ අංකය

සූත්‍රය පිහිටවීම නිවැරදිවීම ලකුණු 02

නිවැරදි පිළිතුර සඳහා ලකුණු 03

05 (මුළු ලකුණු 10 යි.)

(5) (i) නූල් එතීම සඳහා භාවිතා කරන උපකරණ කට්ටලය

මල් චක්‍රය, එතුම් රෝදය, එතුම් කූර, දික් නූල්, කූර හා හැඩ නූල් කූරු (ලකුණු 02)

(ii) මේවා අතරින් එක් උපකරණයක රූප ඇඳීමට (ලකුණු 04)

(iii) පනාව * හරස් නූල් තද කිරීම

* නූල් අවුල් නොවී තබා ගැනීම

* හැදයේ පළල නිසි ලෙස පවත්වා ගැනීම.

පුඩුවැල් * රටාවට අනුව දික් නූල් ඇද ගැනීම

* අඟලට/ සෙන්ටි මීටරයට නියමිත නූල් ඇද ගැනීම

* නූල විවරය සාද ගැනීම

ලීවර * පුඩුවැල් සම්බන්ධ කිරීම

* පාපොලු සම්බන්ධ කිරීම

* යන්ත්‍රගත කිරීමට ආධාර වීම

* නූල් විවර ලබා ගැනීම

පාපොලු * හරස් නූල් යැවීම සඳහා නූල් විවර ලබා ගැනීම

* මෝස්තර ලබා ගැනීම

කොටස් හතර විස්තර කිරීම (ලකුණු 04 යි)

මුළු ලකුණු 10 යි.

(6) (i) (i) භාණ්ඩය ශක්තිමත් වේ.

(ii) භාණ්ඩය සැහැල්ලු බවට පත්වේ.

(iii) වර්ණය වෙනස් වේ.

(iv) ජලය රඳවා ගැනීමේ පහසුව ඇතිවේ. (ඕනෑම පිළිතුරු 2 කට ලකුණු 02)

(ii) 1. සායම් භාවිතයෙන් අලංකාර කිරීම (ලකුණු 03)

2. විවිධ මාධ්‍ය භාවිතා කර අලංකාර කිරීම

3. සුදුසු පිළිතුරට ලකුණු ලබා දෙන්න.

(ලකුණු 05)

(7) (i) අවකාශය, සම්පින්ඩනය, විවිධත්වය

තෝරාගත් ස්ථානය, සමබරතාවය

කැපී පෙනෙන බව නිමාව

කරුණු 4 කට (ලකුණු 02)

(ii) රූප සටහනට අනුව (ලකුණු 03)

(iii) පැහැදිලි බව, නිවැරදිව බව රූප සටහන් අනුව (ලකුණු 05)